# විවාහ චාරිත්‍ර පිළිබඳ හින්දු ආකල්පය

*විජේතුංග, ඩබ්. කේ. ඩී. අසේල සම්පත් 1*

වෛදික මූලාශ්‍රය මගින් අනාවරණය වන පරිදි විවාහය වූ කලි අතීතයේ සිටම කිසියම් නීති පද්ධතියක් අනුව එනම්, පෙර සිට පැවත එන චාරිත්‍ර-වාරිත්‍ර පද්ධතියක් අනුව හැඩ ගැසුණු ක්‍රියාදාමයක් බව හඳුනාගත හැකිය. විවාහ චාරිත්‍ර පිළිබඳ හින්දු ආකල්පය යන පර්යේෂණය සාහිත්‍යාගත මූලාශ්‍රය ඇසුරින් සිදු කිරීමට අපේක්ෂා කෙරේ. හින්දු චාරිත්‍ර අතර විවාහ මංගල චාරිත්‍රවලට ප්‍රමුඛතාව හිමි වේ. ඔවුන්ගේ අනන්‍යතාව ලොවට ප්‍රකටවන අවස්ථාවක් ලෙස විවාහ චාරිත්‍ර හඳුනාගත හැකිය. ආගමික ශාස්ත්‍රානුකූලව මෙකී චාරිත්‍ර අග්නි දෙවියන් මූලික කර ගනිමින් දේව ආශිර්වාදය සහිතව සිදු කරනු ලබයි. විවාහ මංගල චාරිත්‍ර ඉටු කිරීමට පෙර සිදු කරනු ලබන මුල්ම චාරිත්‍රය නම් කේන්දර ගැළපේදැයි බැලීමයි. මෙය දෙපාර්ශවයෙන්ම ඉටු කරනු ලබන චාරිත්‍රයකි. සුබ දිනයකට අනුව රත්තරන් උණු කිරීම මංගල දිනයට ප්‍රථම යෙදෙන සුබ දිනයකදී මනාලයාගේ නිවසේදී සිදු කරනු ලබයි. විවාහ චාරිත්‍රයක් ලෙස මනාලයාට කරාබුවක් දැමීමේ ක්‍රියාවක්ද අතීතයේ පැවත ඇත. මෙය වර්තමානයේ ක්‍රියාත්මක නොවන්නකි. මංගල දිනයේ මනාලයාට තලප්පාවක් බැඳීම හා උරහිස වටා සළුවක් වැනි ඇඳුමක් ඇන්දවීමද හින්දු විවාහ චාරිත්‍රවලට අයත්ය. එසේම හින්දු විවාහ මණ්ඩපය තුළ එරබදු අත්තක් සිටුවීමද පැරණි චාරිත්‍රයකි. එරබදු වෙනුවට බෝ, නුග වැනි අතුද භාවිත කරනු ලබයි. බීජ රෝපණ චාරිත්‍රයද හින්දු විවාහ චාරිත්‍රයකි. මේ සඳහා ධාන්‍ය වර්ග 09ක් යොදා ගනී. මනාලියට ඇයගේ දෙමාපියන් විසින් පැන් ඉස මනාල පාර්ශවය වෙත භාර කිරීම හා මනාලියගේ දකුණු කකුල මනාලයා දෝතින් අල්ලාගෙන පියවර 07ක් තැබීමද හින්දු විවාහ චාරිත්‍රයකි. 08වන පියවරේදී මනාලියගේ දකුණු කකුල මිරිස් ගලක් මත තබා මුදුවක් පැළඳීම සිදුකරනු ලබයි. එසේම නව යුවල තෙවරක් අග්නි ප්‍රදක්ෂිණා කිරීමේ චාරිත්‍රයට හින්දු විවාහ චාරිත්‍රයන්හි ප්‍රධාන තැනක් හිමිවේ. මීට අමතරව අරුන්දතී තාරකාව නැරඹීම, මුදු පැළඳවීම යනුවෙන් විශාල චාරිත්‍ර ප්‍රමාණයක් හින්දු සංස්කෘතිය තුළ අන්තර්ගත වේ. එකී චාරිත්‍ර පිළිබඳව අධ්‍යයනයක යෙදීම මින් අපේක්ෂිතය.

**ප්‍රමුඛ පදඃ** හින්දු ආගම, විවාහය, චාරිත්‍ර, අනන්‍යතාව

[1]*ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර, පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය.*
*aselawijethunga11@gmail.com*